# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,950 - 2016 ජනවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2016.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

## තනතුරු — ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මඩකලපුව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 පෙබරවාරි මස 15 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 දෙසැම්බර් මස 23 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මඩකලපුව | මන්මුනේ උතුර | කොකුවිල් කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මන්මුනේ උතුර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |

01-523

---

### සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

අවලංගු කිරීමයි

***කර්මාන්ත හා වාණිජ කටුයුතු අමාත්‍යාංශයේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 තනතුර (සමාගම් පරීක්ෂක) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම***

උක්ත කරුණ සම්බන්ධව අංක 1920, 2015.06.19 දින හා අංක 1923, 2015.07.10 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නියමය පරිදි අවලංගු කරන ලදී.

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජනවාරි මස 15 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

01-511

---

### සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ආශ්‍රිත නිලධාරි ගණය සඳහා වන තනතුරුවලට විවෘත පදනම මත බඳවා ගැනීම

**(ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි, ප්‍රචාරක නිලධාරි, සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී)**

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි ගණය MN - 04-2006A ට අයත් පහත තනතුරුවල ඒවායේ ඉදිරියෙන් දක්වා ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අංක 2 යටතේ සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* |
|---|---|
| ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි තනතුර | 02 |
| ප්‍රචාරක නිලධාරි තනතුර | 02 |
| සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී තනතුර | 02 |

01. බඳවා ගැනීමේ ක්‍රමය

මෙම නිවේදනයේ පහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :

(i) අධ්‍යාපන සුදුසුකම් : (ඒ ඒ තනතුරට ඉදිරියෙන් දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් අදළ වේ.)

| *තනතුරු නාමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි තනතුර | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව හෝ අධ්‍යාපන විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම |
| ප්‍රචාරක නිලධාරි තනතුර | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ජන සන්නිවේදනය පිළිබඳ උපාධියක් ලබා තිබීම |
| සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී තනතුර | (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතික විද්‍යාව විෂයය සහිතව උපාධියක් ලබා තිබීම |

(පහත අංක ii, iii, iv, v යටතේ ඇති සුදුසුකම් ඉහත සඳහන් තනතුරු තුනටම අදළ වේ.)

(ii) වෘත්තීය සුදුසුකම් : ක්ෂේත්‍රයට අදළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(iii) පළපුරුද්ද : ක්ෂේත්‍රයට අදළව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(iv) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවයේ යෙදීමට තරම් යෝග්‍ය වන යහපත් මානසික හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

(v) වෙනත් සුදුසුකම් :
- (i) අයදුම්පත් කැඳවන අවසාන දිනය වනවිට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- (ii) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- (iii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :
- (i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.
- (ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුලත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.
- (iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේක අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදළ ප්‍රවීනතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිළධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු ය.
- (iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

4. වයස් සීමාව :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

5. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුවMN-4-2006(A) රු. 15,215-10x215-4x240-7x320-15x360-රු. 25,965 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

6. ව්‍යුහගත සම්මුඛ පරික්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 20 | |
| පළපුරුද්ද | 25 | |
| භාෂා ප්‍රවීණතාව | 10 | |
| පරිගණක දැනුම | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.
- (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය,
- (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. අයදුම්පත් ඉදිරිපත් කිරීම :
- (i) අයදුම්පත් 2016.02.16 දිනට හෝ එදිනට පෙර ''ලේකම්, අධ්‍යක්ෂ (පාලන) 07 ශාඛාව, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- (ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත්, 02 වන පිටුව අංක 06 සිට 09 දක්වාත් වන ආකාරයේ පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.
- (iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- (iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදා අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.
- (v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
- (vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
"සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 පෙබරවාරි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි, ප්‍රචාරක නිලධාරී, සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී යන තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම

පදිංචි දිස්ත්‍රික්කය : ☐

අයදුම් කරනු ලබන තනතුර : ☐

01\. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : Mr./ SILVA A. B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02\. 2.1 ලිපිනය (පෞද්ගලික) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ලිපිනය (පෞද්ගලික) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ලිපිනය (රාජකාරි) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 ලිපිනය (රාජකාරී) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථාවක නිළධාරියකු ඔහුගේ රාජකාරි ලිපිනය යෙදිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුය.)

03\. 3.1 උපන්දිනය :
☐☐☐☐ වර්ෂය ☐☐ මාසය ☐☐ දිනය
3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

04\. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05\. 5.1 ස්ත්‍රී/පුරුෂ භාවය :————.
5.2 දුරකථන අංකය (පෞද්ගලික) :————.
5.3 දුරකථන අංකය (කාර්යාලීය) :————.

06\. සුදුසුකම් :
(නිවේදනයේ 02 ඡේදය යටතේ වන සුදුසුකම්)
අධ්‍යාපන සුදුසුකම් :————.
පළපුරුද්ද :————.

07\. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයඳුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශකර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08\. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සම්පූර්ණ නම :————. (රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතුය.)
තනතුර :————.
ලිපිනය :————.

09\. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය පමණි)

මෙම ඉල්ලුම්කරු වන ................. මයා/මිය මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ/ආයතනයේ ......... වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර .........ක කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බවද ඉහත සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බව ද ......... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව/ආයතන :————.
(රබර් මුද්‍රාවකින් සනාථ කල යුතුය.)

01-570

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2014 (2016)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01\. මෙම නිවේදනයේ -
(අ) "ලේකම්" යන පදයෙන් අදහස් කරනුයේ රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වේ.
(ආ) "සේවය" යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවය වේ.

02\. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

ලිඛිත විභාගය.—පහත සඳහන් ප්‍රශ්න පත්‍ර හතර (04) කින් සමන්විත වේ.
01\. සාමාන්‍ය බුද්ධිය
02\. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා
03\. රාජ්‍ය පරිපාලනමය, විෂයානුබද්ධ අධ්‍යයනය 1 (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)
04\. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)

*විභාග දිනය.*—මෙම විභාගය 2016 අප්‍රේල් මස කොළඹ නගරය තුළ දී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය.*- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

03\. පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව 28 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

04\. *සේවා කොන්දේසි*

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 හා 2009.02.20 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

05\. *මාසික වැටුප් පරිමාණය* :-

මෙම සේවයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්. එල්. 1-2006 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 22,935, 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555 (මාසික)

06\. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම ;

*සහ*

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි වැටුප් කේත අංක එම්. එන්. 2-2006 හෝ ඊට ඉහළ එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල්. 1-2006 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම ;

හෝ

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි වැටුප් කේත අංක එම්. එන්. 2-2006 හෝ ඊට ඉහළ එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල්. 1-2006 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

***සටහන*** :
1\. උපාධිය බලපවත්නා දිනය 2014.12.31 දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.
2\. ඉහත සඳහන් කාලය ගණනය කිරීමේ දී රාජ්‍ය සේවය සහ/හෝ පළාත් රාජ්‍ය සේවාවන් හි අදාළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ.

(ඇ) වයස සහ සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම්
(i) 2014.12.31 දිනට වයස් සීමාව අවුරුදු පනස් තුන (53) ට නොවැඩි විය යුතු ය.
(ii) ඉහත 6 (ආ) හි සඳහන් සේවයක/තනතුරක ස්ථිරත්වය ලබා තිබීම.
(iii) පූර්වාසන්න අවුරුදු 05 තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම.
(iv) පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :
(i) සීමිත තරග විභාගය සඳහා වාර දෙක (02) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාග සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.)
(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2014.12.31 දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
(iii) කුමන හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

07\. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

08\. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2:12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 4.0 (II) තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටිමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2016 පෙබරවාරි මස 15 වැනි දිනට පෙර යැවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2014 (2016)'' යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ.

(ඈ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර. අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඊ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේදී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද, විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09\. *විභාගයට ඇතුළුවීම* :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් යොමුකොට එවා ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටිමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශපත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

**සටහන**.- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10\. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ආ) වලංගු විදේශ ගමන් බල පත්‍රය.

11\. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12\. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13\. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :-
(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය.

සටහන : (i) අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(ii) ඉල්ලුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

14\. බඳවා ගැනීමේ ක්‍රමය :-
14.1 ලිඛිත විභාගය :
පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර හතර (04) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් හා එක් එක් විෂය සමත් වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ. :

| | *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත් විය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2. | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා | 100 | 50 |

| විෂයය | ලකුණු ප්‍රමාණය | සමත් විය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 3. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව) | 100 | 50 |
| 4. රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව) | 100 | 50 |

අපේක්ෂකයන් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

14.2 සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ :

(i) සම්මුඛ පරීක්ෂණ, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(අ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

(i) ඉහත අංක 06 ඡේදයෙහි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුව කළමනාකරණ කුසලතාවය, නායකත්ව ගුණාංග, සන්නිවේදන කුසලතාවය සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු විසිපහ (25) කි.

| විෂය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|
| 01 කළමනාකරණ කුසලතාව | 10 |
| 02 නායකත්ව ගුණාංග | 05 |
| 03 සන්නිවේදන කුසලතා | 05 |
| 04 පෞරුෂත්වය | 05 |
| එකතුව | 25 |

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතුරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා, සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතුරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව හා අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහි දී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iv) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන්වන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

***සැළකිය යුතුයි :***
සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගීවීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

15. *ලිඛිත විභාගයේ විෂය නිර්දේශය* :

01. *සාමාන්‍ය බුද්ධිය* :
සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් හා අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 1 1/2 යි, ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.)

02. *ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතාඃ*
ශ්‍රී ලංකාවේ හා ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ ගෝලීය තත්ත්වයන් පිළිබඳ විෂය දැනුම හෝ අපේක්ෂකයාට යොමුකරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 03 යි, ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

03. *රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I : (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)*
රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි ඇති විය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් හෝ සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්ෂකයාට යොමුකර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට අදාළ රාජ්‍ය සේවයේ පිරිචය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 3 යි. ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

04. *රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)*
දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකා/තේමාව ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය හා පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 3 යි- ලකුණු 100 යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 31 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2014 (2016)**

**Limited Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Administrative Service - 2014 (2016)**

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :
2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
2.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම : (උදා : GUNAWARDHANA, H. M. S. K) :——————.
2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.
2.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
27. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව
ස්ත්‍රී - 1 තුළ ලියන්න
2.8 ජාතික හැඳුනුම්පත් අංකය
2.9 විවාහක/අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න
අවිවාහක - 1
විවාහක - 2
2.10 ජන වර්ගය (සිංහල- 1 දෙමළ - 2, ඉන්දියන් දෙමළ -3 මුස්ලිම් - 4, වෙනත් - 5) - අදාළ අංකය කොටුව තුළ ලියන්න.
2.11 උපන් දිනය : වර්ෂය මාසය දිනය
2.12 දුරකථන අංකය

3.0 ඔබ 2014.12.31 දිනට වූ සේවයට/ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න :————.

4.0 (i) *ගැසට් නිවේදනයේ* 6 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේද ? :————.
(අ) 2014.12.31 දිනට වයස :————.
(ආ) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද
*ගැසට් නිවේදනයේ* 06 (ආ) ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 06 (ආ) i/(ආ) ii යන ඒවායින් කුමකින්ද ?
යන්න :————.
උපාධිය ලද දිනය :————.
විශ්වවිද්‍යාලය/ආයතනය :————.
ලියාපදිංචි අංකය :————.
බාහිර/අභ්‍යන්තර :————.
උපාධිය :————.
විෂයයන් :————.
පන්තිය :————.
ඉහළ/පහළ :————.
උපාධිය වලංගු දිනය :————.
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.
(ඇ) විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ බණ්ඩයක් ඇත්නම්) සඳහන් කළ යුතුය. :————.
දැනට දරන තනතුර :————.
එම තනතුර අයත් වන්නේ රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න :————.
ශ්‍රේණිය :————.
පන්තිය/බණ්ඩය :————.
තනතුරට පත් වූ දිනය :————.
එම තනතුරේ ස්ථිරකළ දිනය :————.
වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :————.
අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කළ යුතුය.

| *සේවය/ශ්‍රේණිය නම* | *අදාල රා. පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය උදා : MN2 - 2006 (A)* | *පත් වූ දිනය* |
|---|---|---|
| (1) ………… | ………… | ………… |
| (2) ………… | ………… | ………… |
| (3) ………… | ………… | ………… |
| (4) ………… | ………… | ………… |
| (5) ………… | ………… | ………… |

(ii) *ගැසට් නිවේදනයේ* 6 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2014.12.31 දිනට සක්‍රිය හා සතුටුදායක මුළු සේවා කාලය :————.

5.0 මුදල් ගෙවූ කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න :

ලදුපත (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දාරයක් මෙහි අලවන්න (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න)

6.0 අයදුම්කරුගේ සහතිකය :
2014.12.31 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, *ගැසට් නිවේදනයේ* 06 ආ ඡේදයට අනුව 2014.12.31 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

*ගැසට් නිවේදනයේ* සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක........ හා............. වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

7.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන............ මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන ......... පළාත් සභාව යටතේ වන.................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ .................. තනතුරක සේවය කරන බව ද, 2014.12.31 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට/(අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූළ දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට් නිවේදනයේ* 06 ආ ඡේදයට අනුව අවුරුදු ............ (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදාළ *ගැසට් නිවේදනයෙහි* සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රා යොදන්න)
01-618

————————

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2016)**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ "රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්" වේ. "සේවය" යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන් කර නොමැති අවස්ථාවන්හි දී "ශ්‍රී ලංකා පරිපාලන සේවය" වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදුකරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.02.15 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරාගත යුතු ය.

*ලිඛිත විභාගය* :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර පහ (05) කින් සමන්විත වේ :-
(i) සාමාන්‍ය බුද්ධිය;
(ii) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා;
(iii) ගෝලීය ප්‍රවණතා;
(iv) කළමනාකරණමය අභියෝග්‍යතාව ;
(v) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා.

*විභාග දිනය*.- මෙම විභාගය 2016 අප්‍රේල් මස කොළඹ නගරයේ දී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

*සම්මුඛ පරීක්ෂණය*.- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් පැවැත්වේ. එම පරීක්‍ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව 104කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්‍ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වැනි වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි*.-

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන අති *විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III වැනි ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිර ය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාරගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද තනතුරක හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසිකරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. මාසික වැටුප් පරිමාණය:-මෙම සේවයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි SL -1-2006 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට හිමි වැටුප් පරිමාණය පහත පරිදි වේ :-
රු. 22,935-10x645-8x790-17x1,050-රු.53,555 (මාසික)

6. බඳවා ගැනීමේ සුදුසුකම් :-
(අ) (*i*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම ;
(*ii*) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම. ;

(*iii*) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.
සටහන.- උපාධිය බලපවත්නා දිනය අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතු ය.

(*ඇ*) *වයස :*
අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිදෙකට (22) නොඅඩු විය යුතු අතර අවුරුදු විසිඅටට (28) නොවැඩි විය යුතු ය.
(ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1994.02.15 දින හෝ ඊට පෙර හා 1988.02.15 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

(*ඈ*) *සුදුසුකම් පිළිබඳ සීමාවන් ;*
(*i*) විවෘත තරග විභාගය සඳහා වාර දෙකකට (02) වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත. (පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදාළ කර ගනු නොලැබේ.)
(*ii*) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
(*iii*) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

7. *විභාග ගාස්තු.*-විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතු ය. මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රායෝජනවත් විය හැකිය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම්, හෝ මුද්දර භාර ගනු නොලැබේ.

8. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය.*-
(*අ*) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක් වන ශීර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේ ද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවැනි පිටුවේ ද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක). සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.
(*ආ*) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතු ය.
(*ඇ*) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2016.02.15 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014 (2016)" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.
(*ඈ*) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.
(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.
(*ඊ*) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. *විභාගයට ඇතුළුවීම :*
(*අ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ ඉල්ලුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.
(*ආ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය ආරම්භයේ* පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.*- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත :
(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :-*
(*අ*) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(*ආ*) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතු ය.
(*ඇ*) අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.
(*ඈ*) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

*සටහන :-*
(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම්ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6(ආ) ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.
(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.
(iii) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

14. *බඳවා ගැනීමේ ක්‍රමය.*-
14.1 ලිඛිත විභාගය :
පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර පහ (05) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1 සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා | 100 | 50 |
| 3 ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 4 කළමනාකරණමය අභියෝගතාව | 100 | 50 |
| 5 නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | 100 | 50 |

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු ය.

14.2 සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය
(i) සම්මුඛ පරීක්ෂණ, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් (02) කින් යුක්ත වේ.
(*අ*) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*
(i) ඉහත අංක 06හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.
(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.
(*ආ*) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*
(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| *විෂය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 01 කළමනාකරණ කුසලතාව | 10 |
| 02 නායකත්ව ගුණාංග | 05 |
| 03 සන්නිවේදන කුසලතා | 05 |
| 04 පෞරුෂය | 05 |
| එකතුව | 25 |

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව සහ අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.
(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහි දී ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතුරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබුවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.
(iv) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

සැළකිය යුතුයි.—සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගීවීම, පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

15. *ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :-*
(01) සාමාන්‍ය බුද්ධිය ;
සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 1 1/2යි- ලකුණු 100යි මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)
(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා ;
ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය)
(03) ගෝලීය ප්‍රවණතා :
ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව, ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)
(04) කළමනාකරණමය අභියෝගතාව :
ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 3 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)
(05) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා :
දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
(කාලය පැය 3 යි - ලකුණු 100යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 31 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

## ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2016)

Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Administrative Service - 2014 (2016)

1.0 මාධ්‍යය—
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 පෞද්ගලික තොරතුරු :
2.1 මුල´කුරු අගට යොදා මුල´කුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදාහරණ* : (GUNAWARDHANA, M. G. B. S. K.)
2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.
2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :———.
2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.
2.6 ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0 :- අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐
ස්ත්‍රී - 1
2.7 විවාහක/අවිවාහක බව :
අවිවාහක -1 :- අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐
විවාහක -2
2.8 ජන වර්ගය : අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐
(සිංහල - 1, දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3)
මුස්ලිම් - 4, වෙනත් - 5).
2.9 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
2.10 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
2.11 සුදුසුකම් සැපිරිය යුතු
2016.02.15 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐
2.12 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 (i) උපාධිය ලද දිනය :——.
(ii) විශ්ව විද්‍යාලය/ආයතනය :———.
(iii) ලියාපදිංචි වූ අංකය :———.
(iv) බාහිර/අභ්‍යන්තර :———.
(v) උපාධිය :———.
(vi) විෂයයන් :———.
(vii) පන්තිය :———.
(viii) ඉහළ/පහළ :———.

(ix) විභාග අංකය :———.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :———.

4.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

| (ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

5.0 *අයදුම්කරුගේ සහතිකය :*
මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක...............හා ............ වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

6.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 8 (ඈ) පරිදි විය යුතු ය).* :
මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන.................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

———,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.)

දිනය :———.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි).

7.0 *ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)*
මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................... මහතා/ මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

———,
(ආයතන ප්‍රධානියාගේ අත්සන.)

දිනය :———.
නම :———.
තනතුර :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)
01-619

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2014

අංක 1930/12 හා 2015.09.01 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට සීමිත තරග විභාගය යටතේ බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2016 අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. 2014.12.31 දිනට ;

(I) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-03-2006A) 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (5)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර නියමිත වැටුප් වර්ධක පහ (5) ම උපයාගෙන ඇති,

(II) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

02. විශේෂ පන්තියේ නිලධරයන් සඳහා පහත වැටුප් ක්‍රම බලපැවැත්වේ. (MN-7-2006-A 4 පියවර) රු. 21,125 - 8 x 365 - 18 x 500 - රු. 33,045

03. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය පහත පරිදි වේ :

(i) මෙම විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ 2013.07.03 දින සිට 2013.12.31 දින දක්වා සහ 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා එක් එක් දෙපාර්තමේන්තුවල හා අමාත්‍යාංශවල ඒ ඒ තනතුරේ පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

(ii) විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අදාළ කරගත යුතු වන්නේ 2013.07.03 දින සිට 2013.12.31 දින දක්වා සහ 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

(iii) අනුමත තනතුරු සංඛ්‍යාව 04ක් හෝ ඊට වැඩිවන විට සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 25% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 75% විය යුතු අතර, අනුමත තනතුරු සංඛ්‍යාව 03ක් වන විට ඉහත සීමිත තරග විභාගය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 33.33% හා සේවා පළපුරුද්ද හා කුසලතාවය යටතේ බඳවාගනු ලබන ප්‍රතිශතය 66.66% විය යුතු ය.

(iv) විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 03කට වඩා වැඩි වන්නේ නම් පමණක් සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත එම පුරප්පාඩු පිරවීම සිදු කළ යුතු ය.

(v) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව විභාගයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විභාගය පැවැත් වූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

(vi) පුරප්පාඩු පිරවීමේ දී අයදුම්කරුවන් අතුරින් එක් එක් පුරප්පාඩුව ඇති වූ දිනට මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධරයන් කුසලතාවයේ අනුපිළිවෙල අනුව අදාළ උසස් කිරීම සඳහා සළකා බලනු ලැබේ.

04. (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත. අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති, *ගැසට් නිවේදනයේ* මුල වෙනම මුද්‍රණය කර ඇත.

05. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව රාජ්‍ය සේවයේ නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2016 පෙබරවාරි 15 වැනි දින නොඉක්මවා, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත තම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *හැඳුනුම්පත් :-* විභාග ශාලාවේ දී තමන් පෙනී සිටින එක් එක් විෂයය සඳහා ශාලාධිපති සෑහීමකට පත්වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම් පත්‍රය.
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

07. *අයදුම්පත්‍රය :*

(i) "ඒ4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 05 තෙක් පළමු පිටුවට ඇතුළත් විය යුතු ය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතු ය. අපේක්ෂක/ අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතු ය.
ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල හා දෙමළ ඉල්ලුම්පත්‍රවල අදාළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතු ය.
ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න අයදුම්කරු විසින්ම විමසා බැලීමට කටයුතු කළ යුතු ය. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් සුදුසු වේ.

(ii) අපේක්ෂකයින්ට තම අයදුම්පත්‍රයේ සඳහන් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය සඳහා අයදුම්කරුවන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම ඉදිරිපත් වුවහොත් එම මාධ්‍ය තුනෙන්ම විභාගය පවත්වනු ලබන අතර, අපේක්ෂකයින් විසින් තමා පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය යුතුවේ.

(iii) පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවක් 2003-02-13 වන විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂයට ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපතේ මුල් පිටපත අයදුම්පතේ අදාළ කොටුවේ ඇලවිය යුතු ය.
මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

08. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයත්වන රාජ්‍ය සේවය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේම අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.
විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. ඉහත (08) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සළකා බලනු නොලැබේ.

10. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* :
මෙම විභාගයේ ප්‍රතිඵල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

11. විභාග පරිපාටිය :

(i) I පන්තියේ නිලධාරින් විශේෂ පන්තියට උසස් කිරීම සඳහා වන විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.
(1) අභියෝග්‍යතාව - කාලය පැය 1 කි. - ලකුණු 100 යි.
(2) කළමනාකරණය - කාලය පැය 3 කි. - ලකුණු 100 යි.

සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුවේ.
පළමු වන ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ :–
අභියෝග්‍යතාව - විෂය අංකය (1)
තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්ය සාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප අත්පත් කර ගෙන තිබේ ද යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේ ද යන්න මැන බැලීමේ පරීක්ෂණයකි.
මෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

දෙවැනි ප්‍රශ්න පත්‍රය සඳහා විෂය නිර්දේශය පහත දැක්වේ :–
කළමනාකරණය - විෂය අංකය (2)

(i) කළමනාකරණ මූලධර්ම
(ii) කළමනාකරණ ශ්‍රිත
සැලසුම් කිරීම
තීරණ ගැනීම
තීරණ ගැනීමේ ක්‍රියාවලිය
සංවිධානය
මාණ්ඩලීකරණය
මෙහෙයවීම
අභිප්‍රේරණ ක්‍රියාවලිය
නායකත්වය
පාලනය
පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය
(iii) සහභාගීත්ව කළමනාකරණය
(iv) කළමනාකරණ පරිසරය
(v) සිද්ධි අධ්‍යයනය

මෙය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

13. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙන්නේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,
ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 30 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

#### ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2014

Limited Competitive Examination for the Promotion of the Officers in Grade I of Sri Lanka Technological Service to Special Grade - 2014

01. (*අ*) විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(සිංහල - 2/දෙමළ - 3 / ඉංග්‍රීසි - 4) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයට ද යන වග
(ඔබ අයත් රාජ්‍ය සේවයට අදළ අංකය කොටුව තුළ ලියන්න.)
(බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/දකුණු පළාත් රාජ්‍ය සේවය - 03/උතුරු පළාත් රාජ්‍ය සේවයේ - 04/ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 5/වයඹ පළාත් රාජ්‍ය සේවය - 06/උතුරු මැද පළාත් රාජ්‍ය සේවය - 07/ඌව පළාත් රාජ්‍ය සේවය - 08/සබරගමුව පළාත් රාජ්‍ය සේවය -09/මධ්‍යම රජයේ සේවය - 10)

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(*ඇ*) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(*ඈ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(*ඉ*) රාජකාරි ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)
:————.
(ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්)
:————.
(සිංහලෙන්/දෙමළෙන්)

(*ඊ*) ස්ත්‍රී/පුරුෂ භාවය
(පුරුෂ - 0/ ස්ත්‍රී - 1) (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(*උ*) ජාතික හැඳුනුම්පත් අංකය

(*ඌ*) දුරකථන අංකය

02. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :————.
03. පදවි නාමය :————.
04. 2014.12.31 දිනට සේවා කාලය :
අවුරුදු : මාස : දින :

05. (i) උපන් දිනය :
අවුරුද්ද : මාසය : දිනය :

(ii) 2014.12.31 දිනට වයස :
අවුරුදු මාස දින

| විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට නොවේ නම් රු. 500ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සි අංකය :————.
ගෙවූ කාර්යාලය :————.
ගෙවූ මුදල :————.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතීවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

**සටහන** :- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ තමාගේ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධානියාගේ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

#### අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .......................... මහතා/ මහත්මිය/ මෙනෙවිය

................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

—————,
අත්සන සහතික
කරන්නාගේ අත්සන.
නිලමුද්‍රාව.

දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය

(i) මෙම අයදුම්කරුට එරෙහිව පැවැත්වෙන හෝ පැවති විනය පරීක්ෂණ පිළිබඳ දෙපර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය. :
..................................................................
..................................................................

(ii) ඉහත අංක 01 සිට 05 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, විභාග ගාස්තු ගෙවීමෙන් නිදහස් බවත්/නියමිත විභාග ගාස්තු ගෙවා කුවිතාන්සිය මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය,
නිල මුද්‍රාව.

දිනය :—————.

සටහන .— සහතික කළ එක් පිටපතක් අපේක්ෂකයාගේ පෞද්ගලික ලිපි ගොනුවට යැවිය යුතු අතර අනෙක් පිටපත අප්‍රමාදව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.
01-582

---

## සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය

### දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ (MN-01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරින් III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016

1. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A 4 කඩදසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් 2016.02.05 වැනි දිනට හෝ එදිනට ප්‍රථම ''ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙම අයදුම්පත්‍රය අංක 01 සිට 08 දක්වා පළමු පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ඇතුලත් වන පරිදි සකස් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි ''දිවිනැගුම සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රය සමඟ අයදුම්කරුගේ නම හා ලිපිනය ලියූ රු. 35 ක මුද්දර අලවන ලද කවරයක් ද අමුණා එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :
   - 3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
   - 3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ 2 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.
   - 3.3 තෝරාගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින්කල රජය විසින් නිකුත්කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතුය.

4. සාමාන්‍ය සුදුසුකම් :-
   - 4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
   - 4.2 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
   - 4.3 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටියයුතු අතර, තනතුරේ රාජකාරි ඉටුකිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.
   - 4.4 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු සහ අවු. 30ට නොවැඩි විය යුතුය.

5. අධ්‍යාපන සුදුසුකම් :-

*විවෘත බඳවා ගැනීම :* (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

6. වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද : අදාළ නොවේ.

7. තෝරාගැනීමේ පදනම :
   - 7.1 ලිඛිත තරග විභාගය
   - 7.1.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි
     මේ සඳහා වන ලිඛිත විභාගය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති/ලේඛකාධිකාරී මගින් පවත්වනු ලබන අතර, ඔහු විසින් දනුම් දෙනුලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත්විය යුතු වේ. විභාගයට පෙනීසිටීම සඳහා සෑම අතින්ම සුදුසුකම් සපුරා ඇති බවට සෑහීමකට පත්විය හැකි අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින් නිකුත් කරනු ඇත.
   - 7.1.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමුකරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය.
   - 7.1.3 ලිඛිත විභාගයේ විෂයයන් පහත දැක්වේ :-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| 2. සමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. අභියෝග්‍යතාව | පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 2. සමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනුම | ග්‍රාමීය හා ජාතික මට්ටමේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජයීය, සංස්කෘතික, ආර්ථික හා අනෙකුත් සමාජ සංවර්ධනයන්ට අදළ සාධක පිළිබඳ අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

   - 7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
   - 7.2.1 ලිඛිත විභාගයේ වැඩිම මුළු ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මෙයින් දෙගුණයක් හා සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් ලැබීම අදළ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකමක් ලෙස නොසැලකේ.
   - 7.2.2 ලකුණුදීමේ පටිපාටිය පහත පරිදි වේ :-

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 30 | |
| විභාගය | ලකුණු | | |
| අ. පො. ස. (සා. පෙළ) විභාගය | 12 | | |
| අ. පො. ස. (උ. පෙළ) විභාගය | 18 | | |
| 2. පළපුරුද්ද : තනතුරට අදළ ක්ෂේත්‍රයක ලබා ඇති පළපුරුද්ද මෙහි දී සලකා බලනු ලැබේ. | | 50 | අදාළ නොවේ |
| 3. වෘත්තීය සුදුසුකම් : ක්ෂේත්‍රයට අදළව රජයේ හෝ රජය පිළගත් ආයතනයක හදරා ඇති වෘත්තීය පුහුණු හා පාඨමාලා සඳහා | | 15 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | | 05 | |
| මුළු ලකුණු | | 100 | |

   - 7.3 ලිඛිත පරීක්ෂණයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල මුළු එකතුව අනුව වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් බඳවා ගැනීම් සඳහා තෝරාගනු ලැබේ.

8. *බඳවා ගැනීම :*
   ඉහත 5 යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති, ලිඛිත විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ (MN-01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවාගනු ලැබේ. බඳවා ගන්නා ප්‍රමාණය පවතින පුරප්පාඩු සංඛ්‍යාව, සේවා අවශ්‍යතාවය හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

9. *වැටුප් පරිමාණය :*
   - 9.1 වැටුප් කේත අංකය : MN 01-2006 A
   - 9.2 වැටුප් පරිමාණය : රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320-රු. 22,040

10. *විභාග ගාස්තු :*
   විභාග ගාස්තුව රු. 500 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු. 500 ක් වන විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ''දිවිනැගුම ප්‍රජාමූල බැංකුවක්'' වෙත ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය විභාග අයදුම්පත්‍රයේ අදල ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

11. *විභාගය පවත්වන ස්ථාන :-*
   විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක පහත දැක්වෙන අතර, යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති අවස්ථාවල ඔවුන් ආසන්න විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | කිලිනොච්චිය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මහනුවර | 04 | ත්‍රිකුණාමලය | 17 |
| මාතලේ | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | පුත්තලම | 19 |
| ගාල්ල | 07 | අනුරාධපුරය | 20 |
| මාතර | 08 | පොළොන්නරුව | 21 |
| හම්බන්තොට | 09 | බදුල්ල | 22 |
| යාපනය | 10 | මොණරාගල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| වව්නියාව | 12 | කෑගල්ල | 25 |
| මුලතිව් | 13 | | |

12. යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි සඳහන් කරුණුවල කිසියම් සාවද්‍ය තොරතුරක් සඳහන් කර තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබිය හැකි අතර, තෝරාගැනීමෙන් පසුව වුවද කුමන අවස්ථාවක හෝ ඒබව අනාවරණය වුවහොත් ඔහු හෝ ඇයගේ සේවය අවසන් කරනු ලැබේ.

13. *අත්සන සහතික කිරීම :*
   අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 240, 360 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ''අධ්‍යක්ෂ ජනරාල් වේ.''

චන්ද්‍රා වික්‍රමසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,
4 වන මහල, පළමු අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව***

*දිවිනැගුම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016*

ලිඛිත තරග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : [ ]

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

සිංහල - S දෙමළ - T
(අදළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම :—————.
    (ii) මුලකුරු සමඟ නම (සිංහලෙන් හෝ දෙමළෙන්) :—————.
    (iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

02. ලිපිනය හා දුරකථන අංකය :
    (i) පෞද්ගලික ලිපිනය :—————.
    (ii) ස්ථාවර දුරකථන අංකය :—————.
    (iii) ජංගම දුරකථන අංකය :—————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
    පුරුෂ [ ]
    ස්ත්‍රී [ ] (අදාළ කොටුව තුළ සලකුණු කරන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය [ ]

05. (i) උපන් දිනය : වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]
    (ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු [ ] මාස [ ] දින [ ]

06. විවාහක/අවිවාහක බව :
    විවාහක [ ] (අදළ කොටුව තුළ සලකුණු කරන්න.)
    අවිවාහක [ ]

07. අ. පො. ස. (සා. පෙළ.) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)
    (i) විභාගය සමත් වූ වර්ෂය හා මාසය :—————.
    (ii) අයදුම්කරුගේ විභාග අංකය :—————.

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| I | ...................... | ........... | II | ...................... | ........... |
| III | ...................... | ........... | IV | ...................... | ........... |
| V | ...................... | ........... | VI | ...................... | ........... |
| VII | ...................... | ........... | VIII | ...................... | ........... |
| IX | ...................... | ........... | X | ...................... | ........... |

08. අ. පො. ස (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)
(i) විභාගය සමත් වූ වර්ෂය හා මාසය :————.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| I | ........................... | .................. | II | .............................. | .................. |
| III | .............................. | .................... | IV | .............................. | .................. |

09. විභාග ගාස්තු :

රු. 500.00 ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න.

10. අයදුම්කරුගේ ප්‍රකාශය :ඥ

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයාගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා පත්වීමක් ලැබීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයාගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මාගේ පත්වීම අවලංගු කිරීමට ලක්වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .................................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් ............ දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

12. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම ඉල්ලුම්කරු වන ..................................................... මහතා/මහත්මිය/මෙනෙවිය දනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............ වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිලමුද්‍රාව :————.
01-666

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### මහාධිකරණය - මොණරාගල

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගය අවසන්ව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර්පත් මොණරාගල මහාධිකරණය විසින් නිකුත් කරනු ලබන අයදුම්පත් පමණක් විය යුතු අතර, 2016.01.08 වැනි දින සිට 2016.02.08 දින දක්වා මොණරාගල මහාධිකරණයේ කාර්යාලයෙන් රු. 100ක් ගෙවා ටෙන්ඩර්පත් ලබාගත හැකි ය.

03. ටෙන්ඩර්පත් පිටපත් 02කින් යුක්ත විය යුතු අතර, ඉන් එකක් මුල් ලේඛනය ලෙස ද, අනෙක අනුපිටපත ලෙස ද ලියා 9" x 4" ප්‍රමාණයේ ලිපි කවර දෙකක දමා එම කවර දෙක ඊට ප්‍රමාණයෙන් විශාල කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. එසේ ම එක් එක් වාහන සඳහා වෙන වෙන ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

04. ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් ''රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, මොණරාගල'' යන ලිපිනයට හෝ අතින් භාර දිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''අංක ................. දරන වාහනය සඳහා මිල ගණන්'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. මෙම මිල ගණන් 2016.02.09 දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන පහත සඳහන් පරිදි ඇප තැන්පතුවක් මොණරාගල මහාධිකරණයේ තැන්පත් කර ඊට නිකුත් කළ කුවිතාන්සියේ පිටපතක් ටෙන්ඩර්පතට අමුණා තිබිය යුතු ය.

07. 2016.01.08 දින සිට මෙම වාහන මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් මහතාගේ අවසරය ඇතිව සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා පරීක්ෂාකර බැලිය හැකි ය.

08. ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරුවන් වෙත මොණරාගල මහාධිකරණය ලියාපදිංචි තැපැල් මගින් දන්වා යවනු ලබන අතර, එදින සිට සති 02ක් ඇතුළත සම්පූර්ණ මුදල් වාහන රඳවා ඇති අධිකරණයේ එකවර තැන්පත් කර වාහනය ඉවත් කර ගත යුතු ය. එසේ නොවන අවස්ථාවන්හි දී අදාල ටෙන්ඩර්කරුගේ තැන්පත් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. එසේ ම අදාල කාලය තුළ මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් තක්සේරු මුදලට වැඩියෙන් ඊළඟ වැඩිම වටිනාකමට ඉල්ලුම් කර ඇති ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිරිනමනු ලැබේ.

09. 2016.02.09 වැනි දින ප. ව. 2.00 ට මොණරාගල මහාධිකරණයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකි ය. එසේ නියෝජිතයෙකු සහභාගි කරන අවස්ථාවක දී කොන්දේසි පත්‍රය සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර එවිය යුතු ය. ටෙන්ඩර්කරුගේ හෝ නියෝජිතගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

10. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 0552276696 ඔස්සේ මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබා ගත හැකි ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | වාහනයේ ලියාපදිංචි අංකය | වර්ගය/මාදිලිය | ඇප තැන්පතු රු. | වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය |
|---|---|---|---|---|---|
| 01 | 55443 | UP RB 6770 (ලි. ප. කළ හැකිය) | මහින්ද්‍රා වර්ගයේ ට්‍රැක්ටරය | 2,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 02 | 39171 | UP RA 1635 (ලි. ප. කළ හැකිය) | සොනාලිකා ට්‍රැක්ටරය | 2,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 03 | 53469 | UP LF 1022 (ලි. ප. කළ හැකිය) | JAC HFC 1040K මෝටර් ලොරි රථය | 5,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 04 | 56010 | 270-0966 (ලි. ප. කළ හැකිය) | මැසි ෆර්ගියුසන් ට්‍රැක්ටරය | 1,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 05. | 55660 | 42 ශ්‍රී 1105 (ලි. ප. කළ හැකිය) | ටාටා ලොරි රථය | 5,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
| 06. | 43715 | 26 ශ්‍රී 4450 (ලි. ප. කළ හැකිය) | ASHOK LEYLAND ලොරි රථය | 5,000 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, මොණරාගල |
